පොදු චක්‍ර ලේඛ ලිපි අංක - 02/168/2023

මගේ අංක - TCS/H/15/2020 (T) 1
සෞඛ්‍ය අමාත්‍යාංශය
සුවසිරිපාය, 385,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10
2023.10. 27

සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල / මහනුවර ජාතික රෝහල,
සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
සියලුම ශික්ෂණ රෝහල් / පළාත් මහ රෝහල්/ දිස්ත්‍රික් මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම විශේෂිත ව්‍යාපෘති හා විශේෂ සෞඛ්‍ය ආයතන ප්‍රධානීන්,
සියලුම මූලික රෝහල් වෛද්‍ය අධිකාරිවරුන්,
සියලුම නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරින්,
සියලුම ආයතන ප්‍රධානීන්.

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණි තනතුරු පුරප්පාඩු පිරවීම</u>**

2014. 10. 11 දිනැති අංක 1883/17 දරණ ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාව සහ ඊට ආනුෂංගිකව පසුව සිදු කර ඇති සංශෝධිත ව්‍යවස්ථාවල සඳහන් පරිදි සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටු ලේකම්ගේ අංක HSC/ PRO/ DMAG/ 10/ 03/ 2021 හා 2023.10.13 දිනැති ලිපිය මගින් ලබා දී ඇති නියෝගයන්ට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලද වෛද්‍ය නිළධාරින්, දන්ත ශල්‍ය වෛද්‍ය නිළධාරින්, විශේෂඥ වෛද්‍ය නිළධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා මෙම නිවේදනයේ 7. 1 සහ 7. 2 ඡේද යටතේ දැක්වෙන සුදුසුකම් සහ වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 11. 1. 2. 1. වගන්තිය යටතේ වන සුදුසුකම් ද සපුරාලිය යුතු ය.

02. නිලධාරියා විසින් තම කැමැත්ත පරිදි ප්‍රමාණවත් තනතුරු සංඛ්‍යාවක් කුසලතා ලේඛණයේ හිමි ස්ථානයට මනාප අනුපිළිවෙලින් පත් කරනු ලැබීම සඳහා සඳහන් කර නොමැති විට, ප්‍රමාණවත් මනාප සංඛ්‍යාවක් සලකුණු කල සුදුසුකම් ලත් නිලධාරීන් සියල්ල අනුයුක්ත කිරීමෙන් පසු ඉතිරි පුරප්පාඩු තිබේ නම් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අභිමතය පරිදි පත්වීම් බලධාරියා විසින් තනතුරු ලබා දෙනු ඇත.

03. 2023.10.27 දිනට නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු ලැයිස්තුව ඇමුණුම 2 හි දක්වා ඇත.

04. සුදුසුකම් ඇති සියලු නිළධාරින් ඔවුන්ගේ අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කළ යුතුය. මාර්ගගත අයදුම්පත medserv.health.gov.lk හි ඇත. මාර්ගගත පද්ධතිය 2023.10.30 සිට 2023.11.20 දින දක්වා අයදුම් කිරීම සඳහා සූදානම් කර ඇත.
මාර්ගගත අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව අදාළ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද එහි මුද්‍රිත පිටපත 2023.11.27 දින හෝ ඊට ප්‍රථම ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍රය එවනු ලබන ලියුම් කවරයේ වම්පස "නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ අයදුම්පත"

යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත් මෙම අමාත්‍යාංශයේ ලේකම් හෝ වෙනත් නිළධාරියකු වෙත පෞද්ගලිකව නොඑවිය යුතුය.

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
" සුවසිරිපාය "
අංක 385, පූජ්‍ය බද්දේගම විමළවංශ හිමි මාවත,
කොළඹ 10

05. තම අයදුම්පත් ඉල්ලා අස් කර ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සති දෙකකට පෙර එම අයදුම්පත් ඉවත් කර ගැනීම සඳහා අවසර හිමි වේ. යම් අයදුම්කරුවෙකු තෝරා ගත හොත් පත් කිරීම් බලධරයා විසින් ලබා දෙන තනතුරට වාර්තා කිරීමෙන් අනතුරුව එම නිළධාරියා නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත්වනු ඇත. නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරකට තෝරා ගන්නා ලද අයදුම්කරුවකු නියමිත කාලය තුළ තනතුර භාර නොගන්නේනම් එම නිළධාරියා නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත් වූ අයෙකු ලෙස සලකනු නොලැබේ.

06. අයදුම්පත් කැඳවන අවසන් දින වන 2023. 11. 20 දිනට පහත 7 ඡේදයේ සුදුසුකම් සළකා බලනු ලැබේ.

## 07. සුදුසුකම්

07. 1. 2014. 10. 11 දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11: 1: 1 පොදු මාර්ගෝපදේශ සහ 2021.03.09 දින ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 11: 1: 2. 1 වගන්තිය යටතේ වන විධි විධාන අදාල වේ.

07. 2 (අ) සියලුම නිළධාරින් දැනට රාජ්‍ය සේවයේ සිටින නිළධාරින් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

(ආ) 2023. 11. 20 දිනට අවුරුදු 8 ක අඛණ්ඩ සේවයක් සහිත සේවය ස්ථිර කර ඇති II ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරියකු / දන්ත ශල්‍ය වෛද්‍යවරයකු විශේෂඥ වෛද්‍ය නිළධාරියකු විය යුතු අතර කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්ව තිබිය යුතුය. (අවුරුදු 8 ක කාලය ප්‍රාථමික ශ්‍රේණියට පත් කරන ලද දින සිට ගණන්ගනු ලැබේ.)

(ඇ) දැනට බලාත්මක 2014.10.11 දිනැති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ඨ I හි සහ පරිශිෂ්ඨ II හි සඳහන් මේ දක්වා වරින්වර සේවා ව්‍යවස්ථාවට කරන ලද සියළුම සංශෝධනයන්ට අනුව පශ්චාත් උපාධි සුදුසුකමක් සහිත නිළධාරියකු විය යුතුය.

(ඈ) මෙම ශ්‍රේණිය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2023. 11. 20 දිනය වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020 (I) හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

## 08. සේවා නියමයන් හා කොන්දේසි

(අ) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 97 වගන්තිය අනුව ප්‍රථමයෙන් අවුරුදු 01 ක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ලැබේ. තෝරා ගත් නිළධාරියා වැඩ බැලීමේ කාලය තුළ හෝ එය අවසානයේ හෝ කුමන හෝ අවස්ථාවකදී කවර හෝ හේතුවක් මත එම තනතුර දැරීමට නුසුදුසු බවට ඔප්පු වුවහොත් ඔහු හෝ ඇය කලින් දරණ ලද තනතුරට පෙරළා යවනු ලැබේ.

(ආ) මෙම ශ්‍රේණියේ තනතුරුවලට පත් කරනු ලබන වෛද්‍ය නිළධාරින් / දන්ත ශල්‍ය වෛද්‍යවරුන්/ විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍ය නිළධාරින් හට පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදීමට අයිතියක් නොමැත.

(ඇ) 2014.10.11 දිනැති වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 12.3 වගන්තිය ප්‍රකාරව මෙම ශ්‍රේණියට කරනු ලබන පත්වීම් ස්ථාන මාරුවීම්වලට යටත් වේ.

(ඈ) සියලු පත් කිරීම් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක වනු ඇති අතර දැනටමත් මෙම ශ්‍රේණියේ සිටින නැතහොත් මෙම ශ්‍රේණියේ වැඩ බලන හෝ මෙම තනතුරේ රාජකාරි ඉටු කරන හෝ රාජකාරි ආවරණය කරන නිලධාරියකු තෝරා ගත හොත් එම නිලධරයාට තම පත් කිරීම පෙරදාතම් කිරීම සඳහා ඉල්ලීමට කිසිඳු අයිතියක් නොමැත.

(ඉ) ප්‍රමාණාත්මක තනතුරු සංඛ්‍යාවක් සඳහා කිසියම් අපේක්ෂකයකු අයදුම් කර නොමැති අවස්ථාවක ප්‍රමුඛතා ලේඛණයේ අනුපිළිවෙළ පරිදි තනතුරුවල ස්ථානගතකිරීම් කරන තුරු නිලධරයා අයදුම් නොකරන ලද තනතුරු සඳහා සළකා බැලීමට හැකියාවක් නොමැති බැවින්, ප්‍රකාශයට පත්කරන ලද සියලුම සේවා ස්ථාන සඳහා මනාපය පල කිරීම වඩාත් සුදුසුය.

## 09. වැටුප් පරිමාණය

(අ) නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ තනතුරට තේරී පත්වන අයදුම්කරුවන්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි SL - 01/2016 වැටුප් ඛණ්ඩයේ 12 වන වැටුප් පියවරේ පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිළධාරින්ට අනෙකුත් ලැබිය යුතු දීමනාවන්ට අමතරව මාසිකව රු 6000/ ක වෛද්‍ය පරිපාලන විශ්‍රාම වැටුප් සහිත පෞද්ගලික වෛද්‍ය වෘත්තියේ නොයෙදීම වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) මෙම ශ්‍රේණිය සඳහා විශේෂඥ වෛද්‍ය නිලධාරි ශ්‍රේණියට විධිමත්ව පත් කරනු ලැබ සිටින නිළධාරියකු තෝරාගතහොත් එම නිලධරයාට විශේෂඥ වෛද්‍ය නිළධාරියකුගේ වැටුප සහ දීමනා ලැබීමට හිමිකම ඇත.

**10. සම්මුඛ පරීක්ෂණය සඳහා වන ලකුණු ලබා දීමේ පටිපාටිය.**

10.01. **සේවා කාලය (මුළු ලකුණු 60 )**

10.01.1. ප්‍රාථමික ශ්‍රේණිය (වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 04)

10.01.2. II ශ්‍රේණිය (වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 20 )

10.01.3. I ශ්‍රේණිය (වසරක් සඳහා ලකුණු 02 බැගින් උපරිම ලකුණු 20)

10.01.4. විශේෂඥ ශ්‍රේණිය (වසරක් සඳහා ලකුණු 2 බැගින් සීමාවක් නොවේ.)

සටහන -

(අ) මෙම පටිපාටිය යටතේ ලකුණු ලබා දිය හැක්කේ එක් සේවා ගණයක් යටතේ වන නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා පමණක් වන අතර එම කාල සීමාව සඳහාම වෙනත් ගණයක් යටතේ ලකුණු ලබා දෙනු නොලැබේ.

10.2 අධ්‍යාපන සුදුසුකම් (මුළු ලකුණු 25 යි )

මෙම කාණ්ඩය යටතේ සේවා ව්‍යවස්ථාවෙහි පරිශිෂ්ය I හා II හි ලැයිස්තු ගතව ඇති පශ්චාත් උපාධි අධ්‍යාපන සුදුසුකම් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| | වෛද්‍ය විශාරද (වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය/ ප්‍රජා දන්ත වෛද්‍ය උපාධිය | ලකුණු |
|---|---|---|
| 10.2.1 | මාණ්ඩලික සහතිකය ඇති වෛද්‍ය විශාරද උපාධිය<br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය/ ප්‍රජා දන්ත වෛද්‍ය) | 25 |
| 10.2.2 | මාණ්ඩලික සහතිකය නැති වෛද්‍ය විශාරද උපාධිය<br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය/ ප්‍රජා දන්ත වෛද්‍ය) | 20 |
| 10.2.3 | විද්‍යාපති උපාධිය<br>(වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය/ ප්‍රජා දන්ත වෛද්‍ය) | 15 |
| 10.2.4 | මාණ්ඩලික සහතිකය ඇති අනෙකුත් සියලුම වෛද්‍ය විශාරද උපාධිය | 10 |
| 10.2.5 | මාණ්ඩලික සහතිකය නැති අනෙකුත් සියලුම වෛද්‍ය විශාරද උපාධිය | 08 |
| 10.2.6 | වෙනත් විද්‍යාපති උපාධි | 06 |
| 10.2.7 | ඩිප්ලෝමා | 05 |

සටහන

සේවා ව්‍යවස්ථාවෙහි පරිශිෂ්ඨ I හා II හි ලැයිස්තු ගතව ඇති පශ්චාත් උපාධි අධ්‍යාපන සුදුසුකම් අතරින් ලබාගෙන ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

(ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගෙන තිබිය යුතුය.)

**10. 3. පර්යේෂණ/ ප්‍රකාශන (ලකුණු 10)**

(සෑම පර්යේෂණයකටම / ප්‍රකාශනයකටම ලකුණු 02 බැගින් 05 ක් සඳහා)

(අ) පශ්චාත් උපාධි සුදුසුකම් (MSC, MD, Dip.) සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ/ ප්‍රකාශන මේ යටතේ සළකා බලනු නොලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරන අදාල වලංගු පර්යේෂණ, ප්‍රකාශන සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

(ඇ) ප්‍රකාශන/ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම 01 ~~හා ඇමුණුම 02~~ ලෙස අමුණා ඇත.

**10.4. සම්මුඛ පරීක්ෂණය ( මුළු ලකුණු 05 යි.)**

**(කුසලතාවය, නායකත්වය, ආකල්ප, පෞර්ෂත්වය, හා සන්නිවේදන කුසලතා සඳහා )**

10.5 අදාළ අයදුම්පත්‍ර ආයතන/ විමධ්‍යගත ඒකක/ විශේෂිත ව්‍යාපෘති ප්‍රධානියා මගින් අයදුම්පත් කැඳවන අවසන් දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ යොමු කළ යුතුය. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.6 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1883/17 දරණ 2014.10.11 දිනැති ගැසට්පත්‍රය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහය සහ මේ දක්වා වරින් වර සේවා ව්‍යවස්ථාවට කරන ලද සියළුම සංශෝධනයන්ට අනුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 දරන 2009.02.20 දිනැති ගැසට්පත්‍රය මගින් පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ විධි විධානයන් අදාල වේ

10.7 සිංහල සහ ඉංග්‍රීසි පාඨයන් අතර කිසියම් අනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වෙන්නේ ය.

11. **වැටුප් රහිත නිවාඩු සඳහා අඩු කිරීම්.**

2007.04.16 දිනැති වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 9.4.1 හි XI වගන්තිය සහ 2001.03.22 දිනැති සංශෝධිත වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ 6.1.3.7 සහ 6.1.3.8 ප්‍රකාරව ලකුණු ලබා දෙනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම 01

<u>ප්‍රකාශන ඇගයීම් සඳහා අදාල කර ගත යුතු නිර්ණායක</u>

I. ප්‍රකාශන

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර අංකිත ප්‍රකාශන මාලාවක පළ කරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්.

(අ) සමුළු පත්‍රිකා / උද්ධෘත / අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යයන සම්මේලන , සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදාගත් වාර්තා.

II කර්තෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ. අයදුම්කරුගේ පලමු කතෘන් තිදෙනා අතර තිබේ නම් උපරිම ලකුණු දෙනු ලැබේ.

III එකම දත්ත/ පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන , බොහෝදුරට සමාන නිගමනයන්ට එළඹී ඇති ප්‍රකාශන වෙන් වෙන් ප්‍රකාශන වශයෙන් සළකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවලදී ලකුණු ලබා දීම සඳහා එක් ප්‍රකාශනයක් පමණක් සළකා බලනු ලැබේ.

| | Province & RDHS | Station | POST |
|---|---|---|---|
| 1 | Southern | Matara | DRDHS |
| 2 | Central | Nuwaraeliya | DRDHS |
| 3 | North | Mulathive | DRDHS |
| 4 | Uva | Monaragala | DRDHS |
| | | | |
| | Western | | |
| | Colombo | | |
| 5 | | BHA Homagama | MS |
| 6 | | BH Kethumathi womans Hospital, Panadura | MS |
| | | | |
| 7 | Gampaha | CNTH, Ragama | DD |
| | | | |
| | Southern | | |
| 8 | Matara | DGH Matara/ Godagama | DD |
| 9 | | BH Deniyaya | MS |
| | | | |
| | Hambanthota | | |
| 10 | | DGH, Hambanthota | DD |
| 11 | | BH,Walasmulla | MS |
| 12 | | BH, Thissamaharamaya | MS |
| 13 | | BH, Tangalle | MS |
| | | | |
| | North western | | |
| | Kurunegala | | |
| 14 | | BH Dambadeniya | MS |
| 15 | | BHB Galgamuwa | MS |
| | | | |
| 16 | | DGH Chilaw | DD |
| 17 | Puttalam | BHA Puttalam | MS |
| | | | |
| | North Central | | |
| 18 | | TH Anuradhapura | DD 02 |
| | Anuradhapura | | |
| 19 | | BHA Thambuttegama | MS |
| 20 | | BHB Kebathigollawa | MS |
| 21 | | BHB Kekirawa | MS |
| 22 | | BHB Medawachchiya | MS |
| 23 | | BHB Padaviya | MS |
| | | | |
| 24 | | DGH Polonnaruwa | DD |
| 25 | | National Nephrology Specialized Hospital Polonnaruwa | DD |
| 26 | Polonnaruwa | BHB Hingurakgoda | MS |

| | | | |
|---|---|---|---|
| 27 | | BHB welikanda | MS |
| | | | |
| | Sabaragamuwa | | |
| 28 | | DGH Embilipitiya | DD |
| 29 | Rathnapura | BHB Eheliyagoda | MS |
| 30 | | BHB Kahawatta | MS |
| 31 | | BHB Kalawana | MS |
| 32 | | BHA Balangoda | MS |
| | | | |
| 33 | Eastern | TH Batticoloa | DD 02 |
| 34 | Batticoloa | BHB Eravur | MS |
| | | | |
| 35 | | DGH Ampara | DD |
| 36 | Ampara | BH Dehiattakandiya | MS |
| 37 | | BHB Mahaoya | MS |
| | | | |
| 38 | | BH Kantale | MS |
| 39 | Trincomalee | BH Kinnya | MS |
| 40 | | BH Muttur | MS |
| 41 | | BH Pulmudai | MS |
| | | | |
| 42 | | BHA Akkareipattu | MS |
| 43 | Kalmunai | BHB Potuvil | MS |
| | | | |
| | North | | |
| 44 | Jaffna | BHA point Pedro | MS |
| 45 | | BHB Chavakachchei | MS |
| 46 | | BHB Kayts | MS |
| | | | |
| 47 | | DGH Kilinochchi | DD |
| 48 | Kilinochchi | BHB Mulankavil | MS |
| | | | |
| 49 | Mannar | DGH Mannar | DD |
| 50 | | BHB Cheddikulam | MS |
| | | | |
| 51 | Vavuniya | DGH Mullativu | DD |
| 52 | Mullativu | BHA Mankulam | MS |
| | | | |
| 53 | Uva | DGH Monaragala | DD |
| 54 | Monaragala | BHB Bibila | MS |
| 55 | | BHB Siyambalanduwa | MS |
| 56 | | BHB Wellawaya | MS |
| | | | |
| | | | |
| | Ministry of Health | | |
| 57 | | Port Health Services | DD |